# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

**සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය**
**சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு**
**MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>**எனது இல**<br>**My No** DDD/HO/03/ACC/CA/ISO/01 | ඔබේ අංකය<br>**உமது இல**<br>**Your No** ………………………… | දිනය<br>**திகதி**<br>**Date** 2017.03.13 |

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරි සුභසාධන අරමුදල සඳහා දායක මුදල් අයකිරිම</u>**

**යොමුව:අ** 2016 නොවැම්බර් 03 දිනැති Supreme Court Application No: 253/2016 (F/R) දරණ නිතීපති දෙපාර්තමේන්තුවේ ලිපිය.

**යොමුව:ආ** මාගේ අංක DDD/HO/02/Ad/Legal/253-16 හා 2016.11.09 දරණ ලිපිය.

**යොමුව:ඇ** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරි සුභසාධන අරමුදල සඳහා දායක මුදල් අයකිරීම සම්බන්ධව නිකුත් කරන ලද මාගේ අංක DDD/HO/03/ACC/CA/ISO-01 හා 2017.01.25 දරණ ලිපිය.

**යොමුව:ඈ** මාසික වැටුපෙන් මුදල් අවකරණය කිරීම පිළිබඳව නිකුත් කරන ලද මගේ අංක DDD/HO/03/ACC/14/DELI-2017 හා 2017.02.20 දිනැති ලිපිය.

**යොමුව:ඉ** 2017 මාර්තු 08 දිනැති Supreme Court Application No: 253/2016 (F/R) දරණ නිතීපති දෙපාර්තමේන්තුවේ ලිපිය.

යොමුගත "අ" දරණ නිතිපති දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් නිලධාරි සුභ සාධන අරමුදල සඳහා දායක මුදල් අයකිරිම නැවත ආරම්භ කිරිමට දෙපාර්තමේන්තුව එකඟවූ බැවින් එක් එක් නිලධාරියාගේ ලිඛිත එකඟත්වය ලබා ගැනීමෙන් පසුව එම අයකිරිම සිදු කළ යුතු බවත් ඒ පිළිබඳව සියලුම නිලධාරින් කඩිනමින් දැනුවත් කළ යුතු බවත් දන්වා ඇත.

02. එම ලිපිය මඟින් ලබාදුන් උපදෙස් පරිදි යොමුගත "ආ" ලිපිය මඟින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරි සුභසාධන අරමුදල සඳහා දායක මුදල් අඩු කිරිම 2016 මාර්තු මස සිට අත්හිටුවීමට හේතුවූ කරුණු සහ සුභ සාධන අරමුදල විසින් එම නැවැත්විමට එරෙහිව ගොනු කරන ලද අංක 253/2016 දරණ මුලික අයිතිවාසිකම් නඩුවේ ඉදිරි කටයුතු ප්‍රකාරව නිලධාරි සුභ සාධන අරමුදල සඳහා මුදල් නැවත අයකිරීම සලකා බැලිය යුතු බව සහ ඒ සඳහා සේවකයාගේ කැමැත්ත හෝ නොකැමැත්ත ලබා ගෙන


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya ,Battaramulla**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் ( மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2873802/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | **Hot Line: 011- 2887722** |
| E-mail- | dg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | **Hot Line:0112-885582** | |
| | | **Hot Line : 0112-889007** | | | |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් එම තොරතුරු 2016.12.10 දිනට පෙර දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙස දන්වන ලදී.

03. එසේම යොමුගත "ඇ" ලිපිය මඟින්ද 2017 ජනවාරි මස සිට රු.150.00 ක මාසික සමාජික දායක මුදල එක් එක් පුද්ගලයාගේ වැටුපෙන් අයකර සුභ සාධන අරමුදල වෙත ලබාදෙන ලෙසත් යම් නිලධාරියකු ඔහුගේ වැටුපෙන් නිලධාරි සුභසාධන අරමුදල වෙනුවෙන් දායක මුදල් අඩු කිරීමට අකමැති බව ලිඛිතව දන්වන්නේ නම් ඔවුන්ගේ වැටුපෙන් අදාළ මුදල් අය නොකිරීමටත් එම අකමැති බව ප්‍රකාශ කළ නිලධාරින්ගේ නාම ලේඛනය සුභ සාධන අරමුදලේ භාණ්ඩාගාරික වෙත ලබාදෙන ලෙසත් දන්වන ලදී.

04. එසේම යොමුගත "ඇ" ලිපිය මඟින් මුදල් රෙගුලාසි සංග්‍රහයේ 238 (4) (අ) හා 7 වන පරිශීෂ්ඨය අනුව ව්‍යවස්ථාපිත අය කිරීම් හා දෙපාර්තමේන්තුමය ආපසු අයකිරීම සඳහා සේවකයාගේ කැමැත්ත ලබා ගැනිම අවශ්‍ය නොවන බවත්, සුභ සාධන අරමුදල ඇතුළුව අනිකුත් ව්‍යවස්ථාපිත නොවන අයකිරීම් සේවකයාගේ කැමැත්ත අනුව පමණක් අවකරණ සිදු කළ යුතු බවත් දන්වා ඇත. තවද නීතිපති දෙපාර්තමේන්තුවේ යොමුගත ඉහත ලිපිය මඟින් යොමුගත "අ" දරණ නීතිපති දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීමට ප්‍රතිචාර වශයෙන් 2017.01.25 දින නිකුත් කරන ලද "ඇ" දරණ ලිපිය මඟින් ලබාදුන් උපදෙස් සම්බන්ධයෙන් සුභ සාධන අරමුදලේ පෙත්සම්කරුවන් එකඟතාවයකට පත්වූ බව දන්වා ඇත.

05. ඉහත කරුණු පිළිබඳව සලකා බලා නිලධාරි සුභසාධන අරමුදලේ කටයුතු නිතිපති දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම් වලට අනුව නියමානුකුල කිරීමට හැකි වන පරිදි යොමුගත ආ ලිපිය මඟින් දන්වා ඇති පරිදි **නිලධාරි සුභ සාධන අරමුදලට දායක මුදල් මාසිකව වැටුපෙන් අඩුකිරීම සඳහා එක් එක් නිලධාරියාගේ කැමැත්ත ලිඛිතව වෙන් වෙන් වශයෙන් ලබා ගෙන 2017 අප්‍රේල් 05 දිනට පෙර ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන මෙන් දන්වමි.**

06. මෙ සම්බන්ධව ඔබගේ අවධානය ප්‍රමුඛත්ව පදනමක් යටතේ යොමු කරන මෙන්ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

නීල් බණ්ඩාර හපුහින්න,

අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:

01. අචාර්යය අවන්ති පෙරේරා මිය - ජ්‍යේෂ්ඨ රජයේ අධිනිතිඥ,නිතිපති දෙපාර්තමේන්තුව - කා.දැ.පි